᳓ # ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1,635/16 - 2010 ජනවාරි 05 වැනි අඟහරුවාදා - 2010.01.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිතුමාණන් විසින් කරනු ලබන ප්‍රකාශනයයි**

මුද්‍රාව

**මහින්ද රාජපක්ෂ**

නැගෙනහිර මානුෂීය මෙහෙයුම් පදක්කම සහ සන්දාරය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති වූ ද, රාජ්‍යයේ ප්‍රධානියා වූ ද, විධායකයේ හා ආණ්ඩුවේ ප්‍රධානියා වූ ද, සන්නද්ධ සේවාවන්හි සේනාධිනායක වූ ද, මහින්ද රාජපක්ෂ වන මවිසින්, සියලු දෙනා වෙත සුභාශිංසන පූර්වකව මෙසේ නිවේදනය කරනු ලැබේ.

ශ්‍රී ලංකාවේ නැගෙනහිර ප්‍රදේශය මුදවා ගැනීමේ මානුෂීය මෙහෙයුමට දායක වූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ යුද්ධ, නාවික, ගුවන් හමුදාවන්හි සහ පොලීසියේ ස්ථිර හා ස්වේච්ඡා බල හමුදාවන්හි සියලුම නිල දරන්නන් සහ වෙනත් තැනැත්තන් වෙත උපහාර වශයෙන් පදක්කමක් ප්‍රදානය කිරීම මාගේ අභිලාෂය වන බැවින්,

එම කාර්යය පාලනය කිරීම සඳහා මින් ඉදිරියට අනුල්ලංඝනීය වශයෙන් පිළිපැදිය යුතු වූ ද, ව්‍යවස්ථා හා රෙගුලාසි දැන් මා විසින් මෙසේ සම්පාදනය කොට නියම කොට සංස්ථාපනය කරනු ලැබේ.

**පළමුව** : *සංඥා නාමය.*—මෙම පදක්කම සහ සන්දාරය "නැගෙනහිර මානුෂීය මෙහෙයුම් පදක්කම් සහ සන්දාරය " යන නාමයෙන් හැඳින්විය යුතු යැයි නියම කරනු ලැබේ.

**දෙවනුව** : *විස්තරය.*— ක්‍යුප්‍රෝ නිකල් ලෝහයෙන් වටකුරු හැඩයට නිර්මාණය කළ යුතු පදක්කමෙහි අභිමුඛ පැත්තේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රාජ්‍ය ලාංඡනය සහ ඊට පහළින් මාවිල්ආරු සොරොව්වේ ආකෘතිය නිරූපණය කර එම සංකේත ද්විත්වයට පහතින් "මානුෂිකත්වය" යන පාඨය සිංහල භාෂාවෙන් සඳහන් කර ඒ සියල්ල වටා දිවෙන වක දෙක රටාවකින් නිර්මාණය වූ නෙළුම් පෙති (පලා පෙති) රටාවකින් අවලම්බනය වී උන්නතව නිරූපණය කර තිබිය යුතු ය. ප්‍රතිමුඛ පැත්තේ ඉහළින් මධ්‍ය ගතව යුද්ධ හමුදා ලාංඡනය ද, එයට මඳක් පහතින් වම් පසට වන පරිදි ගුවන් හමුදා ලාංඡනය සහ දකුණු පසින් නාවික හමුදා ලාංඡනය ද ඊට පහතින් නිර්මාණය කර ඇති රටාව තුළ "මානුෂිකත්වය" යන පාඨය සිංහල භාෂාවෙන් සටහන් කළ යුතු අතර, එම පාඨයට පහතින් නැගෙනහිර මානුෂීය මෙහෙයුම පැවති කාලපරිච්ඡේදය වන 2006.07.28 - 2007.07.10 යනුවෙන් සඳහන් කර, ඒ සියල්ල වටා සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා ත්‍රිත්වයෙන් " නැගෙනහිර මානුෂීය මෙහෙයුම" යන පාඨය ද ඒ සියල්ලම වටා දිවෙන වක දෙක රටාවකින් නෙළුම් පෙති (පලා පෙති) රටාවකින් අවලම්බනය වී උන්නතව නිරූපණය කර තිබිය යුතු යැයි නියම කරනු ලැබේ.

1A - G 12288— 360 (2010/01)

**තෙවනුව** : *පීත්ත පටිය.*— දෙපස අයිනේ නැගෙනහිර පළාත් ධජය පිළිබිඹු කෙරෙන සේ පළලින් සෙ.මී. 0.4 කින් යුත් දුඹුරු පැහැති තීරු දෙකක් සහිතව පිළිවෙලින් සෙ.මී. 0.3 කින් යුත් නාවික හමුදාව නිරූපණය කෙරෙන තද නිල් පැහැති පාට තීරුවකින් ද, නැගෙනහිර පළාත් ධජය නිරූපණය කෙරෙන සේ පළලින් සෙ.මී. 0.7 ක කහ පැහැති තීරුවකින් ද, යුද්ධ හමුදාව නිරූපණය කෙරෙන සේ පළලින් සෙ.මී. 0.3 ක තැඹිලි පැහැති තීරුවකින් ද, නැගෙනහිර පළාත් ධජය නිරූපණය කෙරෙන සේ පළලින් සෙ.මී. 0.7 ක තද නිල් පැහැති තීරුවකින් ද, ගුවන් හමුදාව නිරූපණය කෙරෙන සේ පළලින් සෙ.මී. 0.3 ක ලා නිල් පැහැති තීරුවකින් ද යුක්තව පළලින් සෙ.මී. 3.1 කින් ද, දිගින් සෙ.මී. 5 කින් ද යුත් පීත්ත පටියකින් අවලම්බනය වන සේ සකස් කරන ලද පදක්කම, පපුවේ වම් පස පැළඳිය යුතු යැයි නියම කරනු ලැබේ.

**සිවුවනුව** : *සුදුසුකම්.*— පදක්කම - වර්ෂ 2006 ජූලි මස 28 වැනි දින සිට වර්ෂ 2007 ජූලි මස 10 වැනි දින දක්වා වූ කාලය තුළ නැගෙනහිර මානුෂීය මෙහෙයුමට ක්‍රියාකාරීව සහභාගී වූ රාජ්‍ය ආරක්ෂක ඇමති, රාජ්‍ය ආරක්ෂක නියෝජ්‍ය ඇමති, රාජ්‍ය ආරක්ෂක ලේකම්, සන්නද්ධ සේවාධිපතීන්, පොලිස්පති, සක්‍රීය සේවයේ නිරත හමුදා සාමාජිකයින් ඇතුළු සිවිල් වෛද්‍ය නිලධාරීන් සහ ඔවුන්ගේ කාර්ය මණ්ඩලය, පොලීසියේ සාමාජිකයින් සහ සන්නද්ධ සේවාවන් විසින් සේවයේ යොදවන ලදුව මෙහෙයුම ක්‍රියාත්මක කිරීමෙහි ලා ක්‍රියාකාරීව සහභාගී වූ සිවිල් පුද්ගලයින් වෙත මෙහි මින් මතු සම්පාදනය කොට දැක්වෙන කොන්දේසිවලට යටත්ව මෙම පළඳනාව පිරිනැමිය යුතු යැයි නියම කරනු ලැබේ.

*සන්දාරය.*— මෙහි මින් මතු සම්පාදනය කොට දැක්වෙන කොන්දේසිවලට යටත්ව, රාජ්‍ය ආරක්ෂක ඇමති, රාජ්‍ය ආරක්ෂක නියෝජ්‍ය ඇමති, රාජ්‍ය ආරක්ෂක ලේකම්, සන්නද්ධ සේවාධිපතීන්, පොලිස්පති සහ හමුදා සාමාජිකයින් වෙත සන්දාරය පිරිනැමිය යුතුයැයි නියම කරනු ලැබේ.

**පස්වනුව** : *ලියාපදිංචි කිරීම-* පදක්කම හෝ සන්දාරය පිරිනමනු ලැබ ඇති සියලු අයගේ නම්, අදාළ සේවා නියෝගයන්හි පළ කළ යුතු අතර, අදාළව සන්නද්ධ සේවාධිපතිගේ විධානය යටතේ, එම අයගේ නාම ලේඛනයක් පවත්වාගත යුතු යැයි නියම කරනු ලැබේ. පොලීසියේ සාමාජිකයින් සම්බන්ධයෙන් එබඳු අයවළුන්ගේ නාම ලේඛනයක් පොලිස්පතිගේ විධානය යටතේ පවත්වාගත යුතු යැයි ද, සිවිල් පුද්ගලයින් සම්බන්ධයෙන්, එබඳු අයගේ නාම ලේඛනයක් රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ විධානය යටතේ පවත්වාගත යුතු යැයි ද නියම කරනු ලැබේ.

**සයවනුව** : *පැළඳවීමේ අනු පිළිවෙල.*— ප්‍රසාධනා පළඳනා සහ පදක්කම් පැළඳය යුතු අනුපිළිවෙල දැක්වෙන නිල ලේඛනය අනුව දේශපුත්‍ර සම්මානයට ඉක්බිතිව නැගෙනහිර මානුෂීය මෙහෙයුම පදක්කම සහ සන්දාරය පැළඳිය යුතු යැයි නියම කරනු ලැබේ.

**සත්වනුව** : *කුඩා අනුරූප .*— පදක්කම්ලාභීන් විසින් ඇතැම් අවස්ථාවන් හිදී පළඳිනු ලබන්නා වූ ද, කුඩා ප්‍රමාණයේ පදක්කම් යනුවෙන් හැඳින්වෙන්නා වූ ද, කුඩා ප්‍රමාණයේ පදක්කමේ ප්‍රමාණය, ප්‍රදානය කර ඇති පදක්කමේ ප්‍රමාණයෙන් ආසන්න වශයෙන් අර්ධයක් තරම් විය යුතු අතර, එම කුඩා අනුරූපයේ මුද්‍රා තැබූ ආදර්ශකයක්, යුද්ධ, නාවික, ගුවන් සහ පොලිස් මූලස්ථානවල තැන්පත් කර තිබිය යුතු යැයි නියම කරනු ලැබේ.

**අටවනුව** : *අහිමි කිරීම හා නැවත හිමි කර දීම .*— මෙහි මින් මතු පනවනු ලබන රෙගුලාසි යටතේ, යම්කිසි පුද්ගලයකු වෙත ප්‍රදානය කරනු ලැබ ඇති පදක්කමක් අවලංගු කර නිෂ්ප්‍රභා කිරීමට අතිගරු ජනාධිපතිතුමාට හැකි බවට ද, නමුත් එසේ අහිමි කරනු ලැබූ ප්‍රදානයක් යළිත් වලංගු කර ලබාදීමට ද, එතුමාට නීත්‍යානුකූලව බලය ඇති බවට ද, නියම කරනු ලැබේ. අවලංගු කිරීමේ හෝ යළිත් ලබා දීමේ නිවේදනය සෑම අවස්ථාවකදීම අදාළ සේවා නියෝගවල පළ කළ යුතු වේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රාජ්‍ය මුද්‍රාව යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ තිස්එක් වන වර්ෂයේ, එනම් වර්ෂ දෙදහස් නවයක් වූ දෙසැම්බර් මස 17 වැනි දින කොළඹ ජනාධිපති මන්දිරයේ දී ප්‍රදානය කරන ලදී.

ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ලලිත් වීරතුංග,
ජනාධිපති ලේකම්.

**නැගෙනහිර මානුෂීය මෙහෙයුම් පදක්කම සහ සන්දාරය**

ජනාධිපති බලපත්‍රයේ දක්වා ඇති විධිවිධානවලට විස්ථාර වශයෙන් ද, නැගෙනහිර මානුෂීය මෙහෙයුම් පදක්කම සහ සන්දාරය පිරිනැමීමට, අහිමි කිරීමට, පෙරළා හිමිකර දීමට සහ ඒ සම්බන්ධ වෙනත් කරුණුවලට අදාළව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිතුමා විසින් පනවන ලද රෙගුලාසි.

ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ලලිත් වීරතුංග,
ජනාධිපති ලේකම්.

2009 දෙසැම්බර් මස 17 වැනි දින,
කොළඹ,
ජනාධිපති ලේකම් කාර්යාලයේ දී ය.

නැගෙනහිර මානුෂීය මෙහෙයුම් පදක්කම සහ සන්දාරය

1. නැගෙනහිර මානුෂීය මෙහෙයුම් පදක්කම සහ සන්දාරය පහත සඳහන් පරිදි ප්‍රදානය කළ යුතුය.

(අ) පදක්කම පහත සඳහන් අයවළුවන්ට ප්‍රදානය කළ යුතු ය :-

(i) රාජ්‍ය ආරක්ෂක ඇමති, රාජ්‍ය ආරක්ෂක නියෝජ්‍ය ඇමති, රාජ්‍ය ආරක්ෂක ලේකම්, සන්නද්ධ සේවාධිපතීන් සහ පොලිස්පති වෙත ඔවුන් දරන පදවියෙන් ලැබී ඇති වරප්‍රසාද අනුව ;

(ii) නියමිත කාලය තුළ සක්‍රීය සේවයේ යෙදී සිටියා වූ ද, යුද්ධ හමුදාධිපති, නාවික හමුදාධිපති සහ ගුවන් හමුදාධිපති විසින් නිර්දේශ කරනු ලැබ ඇත්තා වූ ද, සියලු සන්නද්ධ හමුදා සාමාජිකයින් වෙත.

(ආ) පහත සඳහන් අය වෙතද පදක්කම් ප්‍රදානය කළ හැකි ය.

(i) නියමිත කාලය තුළ දී නැගෙනහිර ප්‍රදේශයේ සේවය කරන ලද්දා වූ ද, පොලිස්පති විසින් නිර්දේශ කරන ලද්දා වූ ද, පොලීසියේ සාමාජිකයින් වෙත ;

(ii) සන්නද්ධ සේවාවන් විසින් සේවයේ යොදවන ලදුව, නියමිත කාලය තුළ නැගෙනහිර ප්‍රදේශයේ සේවය කළා වූ ද, අදාළ බලධාරියා විසින් නිර්දේශ කරන ලද්දා වූ ද, සිවිල් පුද්ගලයන් වෙත ;

(iii) සන්නද්ධ සේවාවන් විසින් සේවයේ යොදවන ලද්දා වූ ද, නියමිත කාලය තුළ අවම වශයෙන් දින 07ක් සේවය ලබාගත හැකි වන පරිදි නැගෙනහිර ප්‍රදේශයට ශාරීරිකව පැමිණ සිටියාවූ ද, අදාළ බලධාරියා විසින් නිර්දේශ කරන ලද්දා වූ ද, සිවිල් වෛද්‍යවරුන් සහ ඔවුන්ගේ කාර්ය මණ්ඩල වෙත.

(ඇ) සන්දාරය පහත සඳහන් අය වෙත ප්‍රදානය කළ යුතු ය :—

(i) රාජ්‍ය ආරක්ෂක ඇමති, නියෝජ්‍ය ඇමති, රාජ්‍ය ආරක්ෂක ලේකම්, සන්නද්ධ සේවාධිපතීන් සහ පොලිස්පති ඔවුන් දරන පදවියෙන් ලැබී ඇති වරප්‍රසාදය අනුව ;

(ii) මෙහෙයුම් නියෝග ප්‍රකාරව නැගෙනහිර ප්‍රදේශයේ මානුෂීය මෙහෙයුම ක්‍රියාත්මක කළ නියමිත කාලය තුළ දින 30කට නොඅඩුව සේවයේ යෙදී සිටියා වූ ද, සටනේ නිරත වූ ද, ගිනි අවි සහාය, හට කාර්ය සම්පාදනය, වෛද්‍ය සහාය, සැලසුම්, විධානය හෝ තදාශ්‍රිත වෙනත් කිසියම් කාර්යයක හෝ නිරතව සිටියා වූ ද, සියලුම හමුදා සාමාජිකයින් වෙත නැගෙනහිර මානුෂීය මෙහෙයුම් සන්දාරය ප්‍රදානය කළ යුතු ය. ඒ කෙසේ වුව ද, මෙහෙයුම ක්‍රියාත්මක කළ නියමිත කාලය තුළ සටනේ දී අනතුරට පත්, තුවාල ලත්, යුද්ධ හමුදා, නාවික හමුදා සහ ගුවන් හමුදා අයෙකුට දින 30 නියමය අදාළ නොවිය යුතු ය ;

(iii) සේවය ලබා ගැනීමට නැගෙනහිර ප්‍රදේශයට ශාරීරිකව පැමිණ නොසිටි ගුවන් සහ නාවික හමුදා අය සම්බන්ධයෙන් මෙහෙයුමට සහභාගී වූ කාලය අදාළ සන්නද්ධ සේවාධිපතීන් විසින් තීරණය කරනු ලැබිය යුතු අතර, එම කාලය ගුවන් හමුදා අය සම්බන්ධයෙන් සටන්මය හෝ හට කාර්ය සම්පාදනය පියාසර ගමන්වලට සහ නාවික හමුදා අය සම්බන්ධයෙන් වූ කළ, මෙහෙයුම් සහ හට කාර්ය සම්පාදන නාවික ගමන්වලට සීමා කරනු ලැබිය යුතුය.

2. පහත සඳහන් වර්ගයේ හමුදා සාමාජිකයින් පදක්කම හෝ සන්දාරය ලැබීමට සුදුස්සෝ නොවෙති :—

(අ) මෙහෙයුම ක්‍රියාත්මක කළ, නියමිත කාලය තුළ මූලික පුහුණුව ලබමින් සිටි හමුදා සාමාජිකයන් ;

(ආ) මෙහෙයුම ක්‍රියාත්මක කළ, නියමිත කාලය තුළ නිවාඩු නොමැතිව සේවයට නොපැමිණි හෝ සේවයෙන් පැනගිය අය ;

(ඇ) මෙහෙයුම ක්‍රියාත්මක කළ, නියමිත කාලය තුළ, මන්දෝත්සාහී වූ ද, තමන් විසින්ම තමාට තුවාල සිදු කරනු ලැබූවා වූ , සහ හිතා මතාම රාජකාරිය මග හරින ලද්දා වූ අය.

3. මියගිය තැනැත්තෙකු වෙනුවෙන් කෙරෙන ප්‍රදානය, ප්‍රදානලාභියාගේ නීත්‍යානුකූල ළඟම ඥාතියා විසින් හෝ එම ළඟම ඥාතියා විසින් නම් කරනු ලබන තැනැත්තෙකු විසින් භාර ගනු ලැබිය හැකි ය.

4. සෑම නිර්දේශයක් සමගම නිර්දේශිත පුද්ගලයාගේ අංකය, නිලය හා සම්පූර්ණ නම ඇතුළු අනෙකුත් අදාළ සියලු තොරතුරු ද, ඉදිරිපත් කළ යුතු ය.

5. පදක්කම සහ සන්දාරය පිරිනමනු ලැබූ අයගේ නම් අදාළ සේවා නියෝගවල පළ කළ යුතු ය. එම පදක්කම්ලාභීන් සියලු දෙනාගේ ම නාම ලේඛනයක් එනම්, හමුදා අය සම්බන්ධයෙන් අදාළ සන්නද්ධ සේවාධිපතිගේ විධානය යටතේ ද, පොලීසියේ සාමාජිකයන් සම්බන්ධයෙන් පොලිස්පතිගේ විධානය යටතේ ද, සිවිල් පුද්ගලයන් සම්බන්ධයෙන් රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ විධානය යටතේ ද පවත්වාගෙන යා යුතු ය.

6. යුද්ධ, නාවික සහ ගුවන් හමුදාවලින් නෙරපා හරිනු ලබන සහ පහ කරනු ලබන හෝ අධිකාරියන් ඉල්ලා අස් වීමට හෝ විශ්‍රාම ගැනීමට නියම කරනු ලබන සෑම නිලධාරියකුට ම ජනාධිපතිතුමා විසින් මීට වෙනස් ආකාරයක නියෝගයක් නොකරනතාක් ඔහු වෙත ප්‍රදානය කරනු ලැබ ඇති පදක්කම සහ සන්දාරය අහිමි විය යුත්තේ ය.

7. නින්දා සහගතව නොහොත් අපකීර්ති සහගතව යුද්ධ හමුදාවෙන්, නාවික හමුදාවෙන් සහ ගුවන් හමුදාවෙන් අස් කරනු ලබන සෑම සෙබළෙකුටම, නාවික හටයෙකුට හෝ ගුවන් හටයෙකුටම ජනාධිපතිතුමා විසින් මීට වෙනස් ආකාරයක නියෝගයක් කරනතාක් ඔහු වෙත ප්‍රදානය කරන ලද පදක්කම සහ සන්දාරය අහිමි විය යුත්තේ ය.

8. පදක්කම සහ සන්දාරය ප්‍රදානය කරනු ලැබ සිටින තැනැත්තෙක්, රාජ්‍ය ද්‍රෝහීකම, රාජ්‍ය භේදය, කැරලි ගැසීම, බියසුළුකම, සේවය අතහැර යාම හෝ අස්වාභාවික අන්දමේ නින්දනීය හැසිරීම් වැනි වරදකට වරදකරු වූයේ නම්, හෝ විෂමචාරය නිසා සේවයෙන් පහ කරනු හෝ අස් කරනු ලැබුවේ නම් හෝ යුද්ධ හමුදාවේ, නාවික හමුදාවේ හෝ ගුවන් හමුදාවේ නීතියට යටත්ව සිටිය දී සිවිල් බලධාරීන් විසින් වරදකරුවෙකු කරනු ලැබුවේ නම්, එවිට ජනාධිපතිතුමා විසින් මීට වෙනස් ආකාරයක නියෝගයක් නොකරනතාක්, ඔහුට ප්‍රදානය කරන ලද පදක්කම සහ සන්දාරය අහිමි විය යුත්තේ ය.

9. ඕනෑ ම පුද්ගලයෙකුට අහිමි වූ පදක්කම හෝ සන්දාරය ස්වකීය අභිමතය පරිදි පෙරළා හිමි කර දීමට ජනාධිපතිතුමාට හැකි ය.

10. අහිමි කිරීමක් හෝ පෙරළා හිමිකර දීමක් සිදු වන සෑම අවස්ථාවක දී ම ඒ පිළිබඳ නිවේදනයක් අදාළ සේවා නියෝගවල පළ කළ යුතු ය.

11. නැතිවූ පදක්කමක් හෝ සන්දාරයක් වෙනුවට නව පදක්කමක් හෝ සන්දාරයක් ලබා ගැනීමට අපේක්ෂා කරන්නේ නම්, එම නැතිවීම පිළිබඳව පොලීසියට දන්වා සිටිය යුතුය. එය නැති වූයේ කවර තත්ත්වයක් යටතේ ද යන්න ගැන සාම විනිසුරුවරයෙකු විසින් සහතික කරන ලද ප්‍රකාශයක් පොලීසියට කරන ලද පැමිණිල්ල සමග සිය අණදෙන නිලධාරියා වෙත ඉදිරිපත් කළ යුතු ය. ඔහු විසින් එය ලිපි ගනුදෙනු කරන සාමාන්‍ය මාර්ගය ඔස්සේ අදාළ සේවාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය. නැතිවීම සම්බන්ධයෙන් දක්වා ඇති කරුණු සතුටුදායක බව පිළිගනු ලැබුවහොත්, නැතිවූ පදක්කම සහ සන්දාරය වෙනුවට නව පදක්කමක් හෝ සන්දාරයක් මුදල් ගෙවා ලබා ගත හැකි ය. පොලීසියේ සාමාජිකයින් සම්බන්ධයෙන් ප්‍රකාශය, පොලිස්පති වෙත ඉදිරිපත් කළ යුතු අතර, සිවිල් පුද්ගලයින් සහ සිවිල් වෛද්‍යවරුන් සම්බන්ධයෙන් ප්‍රකාශය රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළ යුතු ය.

12. *මෙම රෙගුලාසිවල :—*

| | | | |
|---|---|---|---|
| (අ) | "සේවා" යන්නෙන් | - | ශ්‍රී ලංකා යුද්ධ හමුදාව<br>ශ්‍රී ලංකා නාවික හමුදාව සහ<br>ශ්‍රී ලංකා ගුවන් හමුදාව ද, |
| (ආ) | "සන්නද්ධ සේවාධිපතීන් " යන්නෙන් | - | යුද්ධ හමුදාධිපති<br>නාවික හමුදාධිපති සහ<br>ගුවන් හමුදාධිපති ද, |
| (ඇ) | "හමුදා සාමාජික" යන්නෙන් | - | යුද්ධ හමුදා, නාවික හමුදා සහ<br>ගුවන් හමුදා සාමාජිකයින් ද, |
| (ඈ) | "යුද්ධ හමුදාව" යන්නෙන් | - | ශ්‍රී ලංකා යුද්ධ හමුදාව ද |
| (ඉ) | "නාවික හමුදාව" යන්නෙන් | - | ශ්‍රී ලංකා නාවික හමුදාව ද |
| (ඊ) | "ගුවන් හමුදාව" යන්නෙන් | - | ශ්‍රී ලංකා ගුවන් හමුදාව ද |
| (උ) | "පොලීසිය" යන්නෙන් | - | ශ්‍රී ලංකා පොලීසිය ද |
| (ඌ) | "සෙබළා" යන්නෙන් | - | පිරිමි සෙබළ / කාන්තා සෙබළ ද අදහස් කෙරේ |
| (එ) | "නාවික හටයා" යන්නෙන් | - | නිලධාරියෙකු නොවන නාවික හමුදාවේ සාමාජිකයෙකි. ඊට කාන්තා නාවික සෙබළියන් ද ඇතුළත් වේ. |
| (ඒ) | "ගුවන් හටයා" යන්නෙන් | - | කාන්තා ගුවන් සෙබළිය ද ඇතුළත් වේ. |
| (ඔ) | "අදාළ බලධරයා" යන්නෙන් | - | ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි අදහස් වේ. |
| (ඕ) | "පොලීසියේ සාමාජිකයින් " යන්නෙන් | - | පොලිස් කාන්තාව ද ඇතුළත් වේ. |
| (ක) | "නියමිත කාලය " යන්නෙන් | - | 2006 ජූලි මස 28 දින සිට 2007 ජූලි මස 10 දින දක්වා වූ කාලය අදහස් කෙරේ. |

නැගෙනහිර මානුෂීය මෙහෙයුම් පදක්කම සහ සන්දාරය




‘ ”

**උතුරු මානුෂීය මෙහෙයුම් පදක්කම සහ සන්දාරය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති වූ ද, රාජ්‍යයේ ප්‍රධානියා වූ ද, විධායකයේ හා ආණ්ඩුවේ ප්‍රධානියා වූ ද, සන්නද්ධ සේවාවන්හි සේනාධිනායක වූ ද, මහින්ද රාජපක්ෂ වන මවිසින්, සියලු දෙනා වෙත සුභාශිංසන පූර්වකව මෙසේ නිවේදනය කරනු ලැබේ.

ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රාදේශය මුදවා ගැනීමේ මානුෂීය මෙහෙයුමට දායක වූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ යුද්ධ, නාවික, ගුවන් හමුදාවන්හි සහ පොලීසියේ නිත්‍ය හා ස්වෙච්ඡා බල හමුදාවන්හි සියලුම නිල දරන්නන් සහ වෙනත් තැනැත්තන් වෙත උපහාර වශයෙන් පදක්කමක් ප්‍රදානය කිරීම මාගේ අභිලාෂය වන බැවින්,

එම කාර්යය පාලනය කිරීම සඳහා මින් ඉදිරියට අනුල්ලංඝනීය වශයෙන් පිළිපැදිය යුතු වූ ද, ව්‍යවස්ථා හා රෙගුලාසි දැන් මා විසින් මෙසේ සම්පාදනය කොට නියම කොට සංස්ථාපනය කරනු ලැබේ.

**පළමුව** : *සංඥා නාමය.*— මෙම පදක්කම සහ සන්දාරය " උතුරු මානුෂීය මෙහෙයුම් පදක්කම සහ සන්දාරය " යන නාමයෙන් හැඳින්විය යුතු යැයි නියම කරනු ලැබේ.

**දෙවනුව** : *විස්තරය .*— ක්‍යුප්රෝ නිකල් ලෝහයෙන් වටකුරු හැඩයට සකස් කළ යුතු පදක්කමෙහි අභිමුඛ පැත්තේ මැද උන්නතව, අරිම්බුවකින් වට වූ ශ්‍රී ලංකාවේ කටු සිතියමක් මත දැක්වෙන ස්වාධිපත්‍යය සංකේතවත් කරන සිංහ රූපයකින් ද, ඊට පහළින් සිංහල භාෂාවෙන් "අභිමානය " යන පාඨය ද, ඒ සියල්ල වටා දිවෙන වකදෙක රටාවෙන් නිර්මාණය වූ වී කරල් මෝස්තරයකින් ද සමන්විත විය යුතු ය. ප්‍රතිමුඛ පැත්තේ මැද අරිම්බුවකින් වට වූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රාජ්‍ය ලාංඡනය ද ඊට පහළින් සිංහල භාෂාවෙන් "අභිමානය" යන පාඨය ද ඊටත් පහළින් ක්‍රියාත්විතය පැවැති කාල පරිච්ඡේදය වන 2007.02.26 - 2009.05.18 වැනි දිනයන් ද, ඒ වටා සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් " උතුරු මානුෂීය මෙහෙයුම" යන පාඨය ද ඒ සියල්ලම වටා වකදෙක රටාවෙන් නිර්මාණය වූ වී කරල් මෝස්තරයක් ද උන්නත කැටයමකින් නිරූපණය කර තිබිය යුතු යැයි නියම කරනු ලැබේ.

**තෙවනුව** : *පීත්ත පටිය.*— පිළිවෙලින් එකක් සෙ.මී. 0.75 කින් යුත් උතුරු පළාත් ධජය නිරූපණය වන සේ තද නිල් පාට තීරුවකින් ද, රතු පාට තීරුවකින් ද, තැඹිලි පාට තීරුවකින් සහ කොළ පාට තීරුවකින් ද යුක්තව, පළලින් සෙ.මී. 3 කින් ද, දිගින් සෙ.මී. 5 කින් ද, යුත් පීත්ත පටියකින් අවලම්බනය වන සේ සකස් කරන ලද පදක්කම, පපුවේ වම්පස පැළඳිය යුතු යැයි නියම කරනු ලැබේ.

**සිවුවනුව** : *සුදුසුකම්.*—පදක්කම - වර්ෂ 2007 පෙබරවාරි මස 26 වැනි දින සිට වර්ෂ 2009 මැයි මස 18 වැනි දින දක්වා වූ කාලය තුළ උතුරු මානුෂීය මෙහෙයුමට ක්‍රියාකාරීව සහභාගි වූ රාජ්‍ය ආරක්ෂක ඇමති, රාජ්‍ය ආරක්ෂක නියෝජ්‍ය ඇමති, රාජ්‍ය ආරක්ෂක ලේකම්, සන්නද්ධ සේවාධිපතීන්, පොලිස්පති, සක්‍රිය සේවයේ නිරත හමුදා සාමාජිකයින් ඇතුලු සිවිල් වෛද්‍ය නිලධාරීන් සහ ඔවුන්ගේ කාර්ය මණ්ඩලය, පොලීසියේ සාමාජිකයින් සහ සන්නද්ධ සේවාවන් විසින් සේවයේ යොදවන ලදුව මෙහෙයුම ක්‍රියාත්මක කිරීමෙහි ලා ක්‍රියාකාරීව සහභාගී වූ සිවිල් පුද්ගලයින් වෙත, මෙහි මින් මතු සම්පාදනය කොට දැක්වෙන කොන්දේසිවලට යටත්ව මෙම පදක්කම පිරිනැමිය යුතු යැයි නියම කරනු ලැබේ.

*සන්දාරය.*— මෙහි මින් මතු සම්පාදනය කොට දැක්වෙන කොන්දේසිවලට යටත්ව, රාජ්‍ය ආරක්ෂක ඇමති, රාජ්‍ය ආරක්ෂක නියෝජ්‍ය ඇමති, රාජ්‍ය ආරක්ෂක ලේකම්, සන්නද්ධ සේවාධිපතීන්, පොලිස්පති සහ හමුදා සාමාජිකයින් වෙත සන්දාරය පිරිනැමිය යුතුයැයි නියම කරනු ලැබේ.

**පස්වනුව** : *ලියාපදිංචි කිරීම.*— පදක්කම හෝ සන්දාරය පිරිනමනු ලැබ ඇති සියලුම අයගේ නම්, අදාළ සේවා නියෝගයන්හි පළ කළ යුතු අතර, අදාළ සන්නද්ධ සේවාධිපතිගේ විධානය යටතේ එම අයගේ නාම ලේඛනයක් පවත්වාගත යුතු යැයි නියම කරනු ලැබේ. පොලිසියේ සාමාජිකයින් සම්බන්ධයෙන් එබඳු අයවළුන්ගේ නාම ලේඛනයක් පොලිස්පතිගේ විධානය යටතේ පවත්වාගත යුතු යැයි ද, සිවිල් පුද්ගලයන් සම්බන්ධයෙන් වන නාම ලේඛනයක් රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ විධානය යටතේ පවත්වාගත යුතු යැයි ද නියම කරනු ලැබේ.

**සයවනුව** : *පැළඳවීමේ අනු පිළිවෙල.*—ප්‍රසාධනා පළඳනා සහ පදක්කම් පැළඳිය යුතු අනුපිළිවෙල දැක්වෙන නිල ලේඛනය අනුව නැගෙනහිර මුදවා ගැනීමේ මානුෂීය මෙහෙයුම් පදක්කමට ඉක්බිතිව උතුරු මානුෂීය මෙහෙයුම් පදක්කම සහ සන්දාරය පැළඳිය යුතු යැයි නියම කරනු ලැබේ.

***සත්වනුව*** : කුඩා අනුරූප .—පදක්කම්ලාභීන් විසින් ඇතැම් අවස්ථාවන්හි දී පළඳිනු ලබන්නා වූ ද, කුඩා ප්‍රමාණයේ පදක්කම් යනුවෙන් හැඳින්වෙන්නා වූ ද, කුඩා ප්‍රමාණයේ පදක්කමේ ප්‍රමාණය, ප්‍රදානය කර ඇති පදක්කමේ ප්‍රමාණයෙන් ආසන්න වශයෙන් අර්ධයක් තරම් විය යුතු අතර, එම කුඩා අනුරූපයේ මුද්‍රා තැබූ ආදර්ශකයක්, යුද්ධ, නාවික, ගුවන් සහ පොලිස් මූලස්ථානවල තැන්පත් කර තිබිය යුතු යැයි නියම කරනු ලැබේ.

***අටවනුව*** : *අහිමි කිරීම හා නැවත හිමි කර දීම* .— මෙහි මින් මතු පනවනු ලබන රෙගුලාසි යටතේ, යම්කිසි පුද්ගලයෙකු වෙත ප්‍රදානය කරනු ලැබ ඇති පදක්කමක් අවලංගු කොට නිෂ්ප්‍රභා කරවීමට ජනාධිපතිතුමාට හැකි බවත්, එහෙත් එසේ අහිමි කෙරෙන ප්‍රදානයන් නැවත හිමි ගැන්වීමේ බලය එතුමා සතුවන බවත්, නියම කරනු ලැබේ. තව ද, එපරිද්දෙන් ප්‍රදානය අවලංගු කෙරෙන නොහොත් නැවත හිමි කර දෙනු ලබන්නාවූ සෑම අවස්ථාවකදීම, ඒ පිළිබඳව නිවේදනය අදාළ සේවා නියෝගවල පළ කරනු ලැබිය යුතුයැයි නියම කරනු ලැබේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රාජ්‍ය මුද්‍රාව යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ තිස් එක් වෙනි වර්ෂයේ එනම් වර්ෂ දෙදහස් නවයක් වූ දෙසැම්බර් මස දහහත් වැනි දින කොළඹ ජනාධිපති මන්දිරයේ දී ප්‍රදානය කරන ලදී.

ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ලලිත් වීරතුංග,
ජනාධිපති ලේකම්.

උතුරු මානුෂීය මෙහෙයුම් පදක්කම සහ සන්දාරය

ජනාධිපති බලපත්‍රයේ දක්වා ඇති විධිවිධානවලට විස්ථාර වශයෙන් ද, උතුර මුදවා ගැනීමේ මානුෂීය මෙහෙයුම පදක්කම සහ සන්දාරය පිරිනැමීමට, අහිමි කිරීමට, පෙරළා හිමිකර දීමට සහ ඒ සම්බන්ධ වෙනත් කරුණුවලට අදාළව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිතුමා විසින් පනවන ලද රෙගුලාසි.

ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ලලිත් වීරතුංග,
ජනාධිපති ලේකම්.

2009 දෙසැම්බර් මස 17 වැනි දින,
කොළඹ,
ජනාධිපති ලේකම් කාර්යාලයේ දී ය.

**උතුරු මානුෂීය මෙහෙයුම් පදක්කම සහ සන්දාරය**

1. උතුරු මානුෂීය මෙහෙයුම් පදක්කම සහ සන්දාරය පහත සඳහන් පරිදි ප්‍රදානය කළ යුතුය :—

(*අ*) පදක්කම පහත සඳහන් අයවළුවන්ට ප්‍රදානය කළ යුතු ය :—

(i) රාජ්‍ය ආරක්ෂක ඇමති, රාජ්‍ය ආරක්ෂක නියෝජ්‍ය ඇමති, රාජ්‍ය ආරක්ෂක ලේකම්, සන්නද්ධ සේවාධිපතීන් සහ පොලිස්පති වෙත ඔවුන් දරන පදවියෙන් ලැබී ඇති වරප්‍රසාදය අනුව ;

(ii) නියමිත කාලය තුළ සක්‍රීය සේවයේ යෙදී සිටියා වූ ද, යුද්ධ හමුදාධිපති, නාවික හමුදාධිපති සහ ගුවන් හමුදාධිපති විසින් නිර්දේශ කරනු ලැබ ඇත්තා වූ ද, සියලුම සන්නද්ධ හමුදා සාමාජිකයින් වෙත.

(*ආ*) පහත සඳහන් අය වෙත ද පදක්කම් ප්‍රදානය කළ යුතු ය.—

(i) නියමිත කාලය තුළ උතුරු ප්‍රදේශයේ සේවය කරන ලද්දා වූ ද, පොලිස්පති විසින් නිර්දේශ කරන ලද්දා වූ ද, පොලීසියේ සාමාජිකයින් වෙත ;

(ii) සන්නද්ධ සේවාවන් විසින් සේවයේ යොදවන ලදුව, නියමිත කාලය තුළ උතුරු ප්‍රදේශයේ සේවය කළා වූ ද, අදාළ බලධාරියා විසින් නිර්දේශ කරන ලද්දා වූ ද, සිවිල් පුද්ගලයන් වෙත ;

(iii) සන්නද්ධ සේවාවන් විසින් සේවයේ යොදවන ලද්දා වූ ද, නියමිත කාලය තුළ අවම වශයෙන් දින 21ක් සේවය ලබාගත හැකි වන පරිදි උතුරු ප්‍රදේශයට ශාරීරිකව පැමිණ සිටියාවූ ද, අදාළ බලධාරියා විසින් නිර්දේශ කරන ලද්දා වූ ද, සිවිල් වෛද්‍යවරුන් සහ ඔවුන්ගේ කාර්ය මණ්ඩල වෙත.

*(ඇ)* සන්දාරය පහත සඳහන් අය වෙත ප්‍රදානය කළ යුතු ය :—

(i) රාජ්‍ය ආරක්ෂක ඇමති, රාජ්‍ය ආරක්ෂක නියෝජ්‍ය ඇමති, රාජ්‍ය ආරක්ෂක ලේකම්, සන්නද්ධ සේවාධිපතීන් සහ පොලිස්පති, ඔවුන් දරන පදවියෙන් ලැබී ඇති වරප්‍රසාදය අනුව ;

(ii) මෙහෙයුම් නියෝග ප්‍රකාරව උතුරු ප්‍රදේශයේ මානුෂීය මෙහෙයුම ක්‍රියාත්මක කළ නියමිත කාලය තුළ දින 90කට නොඅඩුව සේවයේ යෙදී සිටියා වූ ද, සටනේ නිරත වූ ද, ගිනි අවි සහාය, හට කාර්ය සම්පාදනය, වෛද්‍ය සහාය, සැලසුම්, විධානය හෝ තදාශ්‍රිත වෙනත් කිසියම් කාර්යයක හෝ නිරතව සිටියා වූ ද, සියලුම හමුදා සාමාජිකයින් වෙත උතුර මුදවා ගැනීමේ මානුෂීය මෙහෙයුම් සන්දාරය ප්‍රදානය කළ යුතු ය. ඒ කෙසේ වුව ද, මෙහෙයුම ක්‍රියාත්මක කළ නියමිත කාලය තුළ සටනේ දී අනතුරට පත්, තුවාල ලත් යුද්ධ හමුදා, නාවික හමුදා සහ ගුවන් හමුදා සාමාජිකයකුට දින 90 නියමය අදාළ නොවිය යුතු ය.

(iii) සේවය ලබා ගැනීමට උතුරු ප්‍රදේශයට ශාරීරිකව පැමිණ නොසිටි ගුවන් සහ නාවික හමුදා සාමාජිකයන් සම්බන්ධයෙන් මෙහෙයුමට සහභාගී වූ කාලය අදාළ සන්නද්ධ සේවාධිපතීන් විසින් තීරණය කරනු ලැබිය යුතු අතර, එම කාලය ගුවන් හමුදා අය සම්බන්ධයෙන් සටන්මය හෝ හට කාර්ය සම්පාදනය පියාසර ගමන්වලට සහ නාවික හමුදා අය සම්බන්ධයෙන් වූ කළ මෙහෙයුම් සහ හට කාර්ය සම්පාදන නාවික ගමන්වලට සීමා කරනු ලැබිය යුතුය.

2. පහත සඳහන් වර්ගයේ හමුදා අය පදක්කම හෝ සන්දාරය ලැබීමට සුදුස්සෝ නොවේ :—

*(අ)* මෙහෙයුම ක්‍රියාත්මක කළ නියමිත කාලය තුළ මූලික පුහුණුව ලබමින් සිටි හමුදා සාමාජිකයන් ;

*(ආ)* මෙහෙයුම ක්‍රියාත්මක කළ නියමිත කාලය තුළ නිවාඩු නොමැතිව සේවයට නොපැමිණි හෝ සේවයෙන් පැනගිය පුද්ගලයන්;

*(ඇ)* මෙහෙයුම ක්‍රියාත්මක කළ නියමිත කාලය තුළ, මන්දෝත්සාහී වූ ද, තමන් විසින්ම තමාට තුවාල සිදු කරනු ලැබූවා වූ සහ හිතා මතාම රාජකාරිය මග හරින ලද්දා වූ පුද්ගලයන්.

3. මියගිය තැනැත්තෙකු වෙනුවෙන් කෙරෙන ප්‍රදානය, ප්‍රදානලාභියාගේ නීත්‍යානුකූල ළඟම ඥාතියා විසින් හෝ එම ළඟම ඥාතියා විසින් නම් කරනු ලබන තැනැත්තෙකු විසින් භාර ගනු ලැබිය හැකි ය.

4. සෑම නිර්දේශයක් සමගම නිර්දේශිත පුද්ගලයාගේ අංකය, නිලය හා සම්පූර්ණ නම ඇතුළු අනෙකුත් අදාළ සියලු තොරතුරු ද , ඉදිරිපත් කළ යුතු ය.

5. පදක්කම සහ සන්දාරය පිරිනමනු ලැබූ අයගේ නම් අදාළ සේවා නියෝගවල පළ කළ යුතු ය. එම පදක්කලාභීන් සියලු දෙනාගේම නාම ලේඛනයක්, එනම් හමුදා සාමාජිකයින් සම්බන්ධයෙන් අදාළ සන්නද්ධ සේවාධිපතිගේ විධානය යටතේ ද, පොලීසියේ සාමාජිකයන් සම්බන්ධයෙන් පොලිස්පතිගේ විධානය යටතේ ද, සිවිල් පුද්ගලයන් සම්බන්ධයෙන් රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ විධානය යටතේ ද පවත්වාගෙන යා යුතු ය.

6. යුද්ධ, නාවික සහ ගුවන් හමුදාවලින් නෙරපා හරිනු ලබන සහ පහ කරනු ලබන හෝ අධිකාරියෙන් ඉල්ලා අස් වීමට හෝ විශ්‍රාම ගැනීමට නියම කරනු ලබන සෑම නිලධාරියකුටම ජනාධිපතිතුමා විසින් මීට වෙනස් ආකාරයක නියෝගයක් නොකරනතාක් ඔහු වෙත ප්‍රදානය කරනු ලැබ ඇති පදක්කම සහ සන්දාරය අහිමි විය යුත්තේ ය.

7. නින්දා සහගතව නොහොත් අපකීර්ති සහගතව යුද්ධ හමුදාවෙන්, නාවික හමුදාවෙන් සහ ගුවන් හමුදාවෙන් අස් කරනු ලබන සෑම සෙබළෙකුටම, නාවික හටයකුට හෝ ගුවන් හටයකුටම ජනාධිපතිතුමා විසින් මීට වෙනස් ආකාරයක නියෝගයක් කරනතාක් ඔහු වෙත ප්‍රදානය කරන ලද පදක්කම සහ සන්දාරය අහිමි විය යුත්තේ ය.

8. පදක්කම සහ සන්දාරය ප්‍රදානය කරනු ලැබ සිටින තැනැත්තෙක්, රාජ්‍ය ද්‍රෝහීකම, රාජ්‍ය භේදය, කැරලි ගැසීම, බියසුළුකම, සේවය අතහැර යාම හෝ අස්වාභාවික අන්දමේ නින්දනීය හැසිරීම් වැනි වරදකට වරදකරු වූයේ නම්, හෝ විෂමචාරය නිසා සේවයෙන් පහ කරනු හෝ අස් කරනු ලැබුවේ නම් හෝ යුද්ධ හමුදාවේ, නාවික හමුදාවේ හෝ ගුවන් හමුදාවේ නීතියට යටත්ව සිටිය දී සිවිල්

බලධාරීන් විසින් වරදකරුවකු කරනු ලැබුවේ නම්, එවිට ජනාධිපතිතුමා විසින් මීට වෙනස් ආකාරයක නියෝගයක් නොකරනතාක්, ඔහුට ප්‍රදානය කරන ලද පදක්කම සහ සන්දාරය අහිමි විය යුත්තේ ය.

9. ඕනෑ ම පුද්ගලයකුට අහිමි වූ පදක්කම හෝ සන්දාරය ස්වකීය අභිමතය පරිදි පෙරළා හිමි කර දීමට ජනාධිපතිතුමාට හැකි ය.

10. අහිමි කිරීමක් හෝ පෙරළා හිමිකර දීමක් සිදු වන සෑම අවස්ථාවකදීම ඒ පිළිබඳ නිවේදනයක් අදාළ සේවා නියෝගවල පළ කළ යුතු ය.

11. නැති වූ පදක්කමක් හෝ සන්දාරයක් වෙනුවට නව පදක්කමක් හෝ සන්දාරයක් ලබා ගැනීමට අපේක්ෂා කරන්නේ නම්, එම නැතිවීම පිළිබඳව පොලීසියට දන්වා සිටිය යුතු ය. එය නැති වූයේ කවර තත්ත්වයක් යටතේ ද, යන්න ගැන සාම විනිසුරුවරයකු විසින් සහතික කරන ලද ප්‍රකාශයක් පොලීසියට කරන ලද පැමිණිල්ල සමග සිය අණදෙන නිලධාරියා වෙත ඉදිරිපත් කළ යුතු ය. ඔහු විසින් එය ලිපි ගනුදෙනු කරන සාමාන්‍ය මාර්ගය ඔස්සේ අදාළ සේවාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය. නැතිවීම සම්බන්ධයෙන් දක්වා ඇති කරුණු සතුටුදායක බව පිළිගනු ලැබුවහොත්, නැතිවූ පදක්කම් සහ සන්දාරය වෙනුවට නව පදක්කමක් හෝ සන්දාරයක් මුදල් ගෙවා ලබා ගත හැකි ය. පොලීසියේ සාමාජිකයින් සම්බන්ධයෙන් ප්‍රකාශය, පොලිස්පති වෙත ඉදිරිපත් කළ යුතු අතර, සිවිල් පුද්ගලයින් සහ සිවිල් වෛද්‍යවරුන් සම්බන්ධයෙන් ප්‍රකාශය රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළ යුතු ය.

12. මෙම රෙගුලාසිවල :—

| | | | |
|---|---|---|---|
| (අ) | "සේවා" යන්නෙන් | - | ශ්‍රී ලංකා යුද්ධ හමුදාව<br>ශ්‍රී ලංකා නාවික හමුදාව සහ<br>ශ්‍රී ලංකා ගුවන් හමුදාව අදහස් වේ. |
| (ආ) | "සන්නද්ධ සේවාධිපතීන්" යන්නෙන් | - | යුද්ධ හමුදාධිපති<br>නාවික හමුදාධිපති සහ<br>ගුවන් හමුදාධිපති අදහස් වේ. |
| (ඇ) | "හමුදා සාමාජිකයින්" යන්නෙන් | - | යුද්ධ හමුදා, නාවික හමුදා සහ<br>ගුවන් හමුදා සාමාජිකයින් අදහස් වේ. |
| (ඈ) | "යුද්ධ හමුදාව" යන්නෙන් | - | ශ්‍රී ලංකා යුද්ධ හමුදාව අදහස් වේ. |
| (ඉ) | "නාවික හමුදාව" යන්නෙන් | - | ශ්‍රී ලංකා නාවික හමුදාව අදහස් වේ. |
| (ඊ) | "ගුවන් හමුදාව" යන්නෙන් | - | ශ්‍රී ලංකා ගුවන් හමුදාව අදහස් වේ. |
| (උ) | "පොලීසිය" යන්නෙන් | - | ශ්‍රී ලංකා පොලිසීය අදහස් වේ. |
| (ඌ) | "සෙබලා" යන්නෙන් | - | පිරිමි සෙබළ / කාන්තා සෙබළ අදහස් වේ. |
| (එ) | "නාවික භටයා" යන්නෙන් | - | නිලධාරියෙකු නොවන නාවික හමුදාවේ සාමාජිකයකු අදහස් වේ. ඊට කාන්තා නාවික සෙබළියන් ද ඇතුළත් වේ. |
| (ඒ) | "ගුවන් භටයා" යන්නෙන් | - | කාන්තා ගුවන් සෙබළියන් ද ඇතුළත් වේ. |
| (ඔ) | "අදාළ බලධරයා" යන්නෙන් | - | ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී අදහස් වේ. |
| (ඕ) | "පොලීසියේ සාමාජිකයින්" යන්නෙන් | - | පොලිස් කාන්තාව ද ඇතුළත් වේ. |
| (ක) | "නියමිත කාලය" යන්නෙන් | - | 2007 පෙබරවාරි මස 26 දින සිට 2009 මැයි මස 18 දින දක්වා වූ කාලය අදහස් කෙරේ. |

## උතුරු මානුෂීය මෙහෙයුම් පදක්කම සහ සන්දාරය

## NORTH HUMANITARIAN OPERATION MEDAL AND CLASP

**OBVERSE**



**REVERSE**



**CLASP**





ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.